# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office (94)-11-2484500 (94)-11-2484600 (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2016-03-08


රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2016

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

## රාජ්‍ය ව්‍යවසායයන්හි අතිරික්ත සේවකයින් සඳහා වන ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය

### 1) හැඳින්වීම

ආර්ථිකමය හා අනෙකුත් ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට ජනනය කිරීම රාජ්‍ය ව්‍යවසායයන් පිහිටුවීමේ අරමුණ වේ. එසේ වුව ද, රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් සමහරක් අපේක්ෂිත ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට ලබා දීමට අපොහොසත්වී ඇති අතර මහා භාණ්ඩාගාරයට බරක් වෙමින් පාඩු ලබන බව නිරීක්ෂණය කර ඇත. අනෙකුත් සාධක අතර, අතිරික්ත කාර්ය මණ්ඩල මෙම අලාභදායිත්වය සඳහා හේතු වී ඇති බව නිරීක්ෂණය කර ඇත. එබැවින් රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා ඒවායේ කාර්ය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මතුව ඇත.

මෙම පසුබිම තුළ, රාජ්‍ය ව්‍යවසායයන් ඒකාබද්ධ කිරීම, වසා දැමීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම යන අවස්ථාවල අනුගමනය කල හැකි ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් සඳහා අංක 16/0213/719/008 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා වන 2016.02.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.

## 2) රාජ්‍ය ව්‍යවසායයන්හි අතිරික්ත සේවකයින් සඳහා යෝජිත ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය සඳහා සේවකයන් හඳුනා ගැනීම

රාජ්‍ය ව්‍යවසායයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම ආයතනයේ අතිරික්ත සේවක සංඛ්‍යාව තක්සේරු කොට හඳුනාගැනීම, මූලිකව සිදු කළ යුතුය. අතිරික්ත සේවක සංඛ්‍යාව තීරණය කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය (Approved Cadre) යොදා ගත හැකිය. මෙහිදී ආයතනයේ මූලික කාර්යයන් (Core Functions) ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය අවම සේවක සංඛ්‍යාව රඳවා ගැනීම කළමනාකාරීත්වය සතු වගකීමකි. තව ද, මෙම යෝජනා ක්‍රමය ඉහත පරිදි හඳුනා ගනු ලැබූ අතිරික්ත සේවකයින් විශ්‍රාම ගැන්වීම සඳහා පමණක් අදාළ බව සැලකිය යුතු ය.

එසේම විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර අතිරික්ත සේවකයින් විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව කඩිනමින් සංශෝධිත කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු බැව් අවධාරණය කෙරේ. එසේම එලෙස අනුමත කරන ලද සේවක සංඛ්‍යාව අභිබවා අනාගතයේදී සේවකයින් බඳවා ගැනීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට සභාපතිවරයා ඇතුළු පාලක මණ්ඩලය විසින් කටයුතු කළ යුතු වේ. මෙකී සීමාවන්ගෙන් බැහැරව කටයුතු කරන්නේනම් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා ඉහළ කළමනාකරණය සාමූහිකව හා පෞද්ගලිකව වගකීමට බැඳේ. එමෙන්ම මෙම ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට හැකි සෑම පියවරක්ම ගත යුතු ය.

## 3. වන්දි ගණනය කිරීමේ පදනම

සේවක විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය පහත දක්වන සේවා ගණයන් සඳහා ස්ථර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

**අ) වසර 10 ක් හෝ වසර 10 කට වැඩි සේවා කාලයක් ඇති සේවකයින් සඳහා**

I. පූර්ව සේවා කාලය - සේවය සම්පූර්ණ කළ සෑම වසරක් සඳහා මාස 02 ක වැටුප

II. කැප කරනු ලබන සේවා කාලය - ඉදිරියට සේවය කිරීමට ඇති සෑම සම්පූර්ණ වසරක් සඳහා මාස 1.5 ක වැටුප

**ආ) වසර 10 ට අඩු සේවා කාලයක් ඇති සේවකයින් සඳහා**

i. සේවය කළ සෑම සම්පූර්ණ වසරක් සඳහා මාස 05 ක වැටුප

ii. කැප කරනු ලබන සේවා කාලය සඳහා ගෙවීම් කරනු නොලැබේ.

## 4. ගෙවීම් සීමා

| | අවම සීමාව | උපරිම සීමාව |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | Rs.450,000 | Rs.2,500,000 |
| ද්විතික ශ්‍රේණිය | Rs.350,000 | Rs.1,800,000 |
| ප්‍රාථමික ශ්‍රේණිය | Rs.250,000 | Rs.1,200,000 |

## 5. සේවක වර්ගීකරණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 34 (i) අනුව අදාළ සේවා වර්ගීකරණයන් පහත පරිදි වේ.

| අදාළ ශ්‍රේණිය | වැටුප් කේතය |
|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි | MM, AR,HM |
| ද්විතීයික ශ්‍රේණි | MA, JM |
| ප්‍රාථමික ශ්‍රේණි | PL 1,2,3 |

## 6. අනෙකුත් කොන්දේසි

i. ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් නොවන සේවකයින් සඳහා (කොන්ත්‍රාත් ගිවිසුම් මත සේවය කරනු ලබන සේවකයින් හැර) පහත පරිදි වන්දි මුදල් ගණනය කළ යුතු ය.

අ) සේවය සම්පූර්ණ කළ සෑම සම්පූර්ණ වසරක් සඳහා මාස 02 ක වැටුප

ආ) අවම වන්දි මුදල මාස 12 ක වැටුප විය යුතු ය.

ඇ) වන්දි ගණනය කිරීමේ ක්‍රමවේදය (දිනක වැටුප x 22 x සේවය කර ඇති මාස ගණන)

ii. යෝජනා ක්‍රමය සඳහා හිමිකම් ලබනුයේ වයස (50 ද ඇතුළුව) අවුරුදු 50 ට අඩු සේවකයින් පමණි. සේවක වන්දි ගණනය කිරීම සඳහා වෛකල්පිත විශ්‍රාම යෑමේ වයස අවුරුදු 55 ලෙස සැලකිය යුතු ය.

iii. වන්දි ගණනය සඳහා ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමට නියමිත මාසයේ ඒකාබද්ධ මූලික වැටුප පදනම් කර ගත යුතු ය. (අන්තර් දීමනා හා අනෙකුත් දීමනා මීට ඇතුළත් නොවේ).

iv. ආයතනය විසින් වන්දි මුදලට අමතරව අදාළ පනත් අනුව ගෙවිය යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කළ යුතු ය.

v. විනයානුකූල පරීක්ෂණ සිදු කෙරෙමින් පවතින සහ යම් විනිශ්චය සභාවක් යටතේ සිය වෘත්තීමය තත්ත්වය ප්‍රශ්නගතව ඇති සේවකයන් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් නොලබනු ඇත.

vi. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ පසු එම ආයතන සඳහා ස්ථිර, අනියම්, කොන්ත්‍රාත්, ආදේශන හෝ වෙනත් කිසිදු පදනමක් මත සේවකයින් සංශෝධිත අනුමත කාර්යය මණ්ඩල සංඛ්‍යාවෙන් බැහැරව බඳවා ගැනීම නොකළ යුතු ය. කොන්ත්‍රාත් ගිවිසුම් මත සේවය කරන සේවකයින්ගේ සේවය,

අදාළ ගිවිසුම් කාලය අවසන් වීමත් සමග අහෝසි වන අතර මෙම වන්දි යෝජනා ක්‍රමය යටතේ දීමනාවක් ලැබීමට එවැනි සේවකයින් හට කිසිදු හිමිකමක් නොමැත.

vii. ආයතනයට අය වීමට ඇති සියළුම හිඟ මුදල් අදාල සේවකයන්ට හිමි වන්දි මුදලෙන් අය කර ගැනීමට පියවර ගනු ඇත.

viii. මෙම වන්දි යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබා සේවයෙන් විශ්‍රාම ගනු ලබන ඕනෑම අයෙකු හට කිසිදු අවස්ථාවක රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජයට අයත් සමාගම් ද ඇතුළුව රාජ්‍ය අංශයේ යළි පත්වීමක් ලැබීමට කිසිදු හිමිකමක් නොමැත.

**7) අදාළත්වය**

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව වසා දමන/ ඒකාබද්ධ කරන/ ප්‍රතිව්‍යුහගත කරන රාජ්‍ය ව්‍යාපාර ලෙසට හඳුනාගෙන ඇති ආයතන සඳහා පමණක් මෙම ස්වේච්ඡා වන්දි ක්‍රමය අදාළ වන අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩල බඳවාගැනීම් හෝ නැවත ඇති කිරීම් සිදු නොකළ යුතු වේ.

**8) පෙර චක්‍රලේඛය අවලංගු වන හා නව චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය**

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 10 සහ 10 (1) මේ සමඟ අවලංගු වන අතර මෙම චක්‍රලේඛය 2016 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වේ.

**9) අයදුම්පත්‍රය**

ආදර්ශ අයදුම්පත්‍රය ඇමුණුම 1 ලෙස මේ සමඟ අමුණා ඇත.

**10) මෙම චක්‍රලේඛය පිළිබඳ පැහැදිළි කිරීම්**

මෙම චක්‍රලේඛය පිළිබඳ යම් පැහැදිළි කිරීමක් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පහත දුරකථන අංකයන්ගෙන් ඒ පිළිබඳ තොරතුරු ලබා ගත හැක. (දු.අංක 0112-484628 හෝ 0112-484617)

අ/කලේ: එස්.පී. වෙල්ලප්පිලි
වැඩ බලන භාණ්ඩාගාර ලේකම්

පිටපත්
1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# ස්වේච්ඡා වන්දි ක්‍රමය සඳහා ඉල්ලුම්පත

**ඇමුණුම 1**

**සේවකයන් විසින් පිරවිය යුතුය**

**කොටස 1**

1. සේවකයාගේ නම :
2. ජා.හැ.අංකය හා සේවක අර්ථසාධක අරමුදල් අංකය :
3. තනතුර :
4. උපන් දිනය :
5. සේවයට බැඳුනු දිනය (තාවකාලික සේවා කාලයක් ඇත්නම්) :
6. සේවය කළ වසර ගණන :

වෛකල්පිත විශ්‍රාම වයස එළඹෙන දිනය :

7. පහත තොරතුරු සත්‍ය බවට සහතික කරමි :

(අ) ඉහත ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,

(ආ) .........................................................(ආයතනයේ නම) ගෙවීමට ඇති සියළුම ආකාරයේ සියළුම ණය/හිඟ ආදිය අයකර ගැනීමටත්,

(ඇ) ඉහත සඳහන් ප්‍රකාශ අසත්‍ය බවට හෙලිදරව් වුවහොත් මා හට ......................... (ආයතනයේ නම) ලබා දුන් ගෙවීම් මාගෙන් අය කර ගැනීමටත් ඒ සම්බන්ධයෙන් මා විසින් ...................... (ආයතනයේ නම) නීතිමය පියවර නොගන්නා බවටත්,

(ඈ) 2016.03.08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2/2016 හි විධිවිධාන අනුව ....................... (ආතනයේ නම) සේවයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමට එකඟ වෙමි.

අයදුම්කරුගේ අත්සන

දිනය

ස්ථානය

ඇමුණුම 1

**ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය සඳහා අයදුම්පත්‍රය**

කළමනාකරණ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

...................................................( ආයතනයේ නම)

(නියමිත කාර්ය පටිපාටිය අනුව)

මහත්මයාණෙනි/ මහත්මියණි,

ස්වේච්ඡා විශ්‍රාමික

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2016.03.08 දිනැති අංක 02/2016 දරණ චක්‍රලේඛයේ සඳහන් වන ක්‍රියාව කියවා තේරුම් ගෙන ......................................... (ආයතනයේ නම) සේවයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමට දන්වමි.

මා විසින් ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය යටතේ ඇති කොන්දේසි සඳහා කොන්දේසි විරහිතව හා නැවත අස්කර නොගන්නා ලෙස එකඟ වෙමි.

................................................ (ආයතනයේ නම) මගේ සේවයෙන් ...................... (දිනය) දින සිට ස්වේච්ඡා විශ්‍රාමයාම සඳහා අවශ්‍ය ලිකියවිලි මාගේ විශ්‍රාම ගැනීම ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කරමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී

අයදුම්කරුගේ අත්සන

තනතුර

නම

ස්ථානය

දිනය